**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට**

**5 ශ්‍රේණිය සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2026**

**ප්‍රතිඵල නිකුත් කිරීම**

2026 අගෝස්තු මස 09 වන දින පැවති උක්ත විභාගයේ ප්‍රතිඵල, 2026 සැප්තැම්බර් 02 දින නිකුත් කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

| | | |
|---|---|---|
| අයදුම් කළ සංඛ්‍යාව | - | 294,132 |
| පෙනී සිටි සංඛ්‍යාව | - | 289,867 |
| කඩඉම් ලකුණෙන් ඉහළ සංඛ්‍යාව | - | 56,000 |

- ➢ ප්‍රතිඵල ලබා ගත හැකි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවි, www.doenets.lk හෝ www.results.exams.gov.lk
  - විභාග අයදුම්කරුගේ නිවැරදි විභාග අංකය ඇතුළත් කිරීමෙන් ප්‍රතිඵල ලබා ගත හැකි අතර, අදාළ විභාග ප්‍රතිඵල සටහන බාගත කර මුද්‍රිත පිටපතක් ලබා ගැනීමටද පහසුකම් සලසා ඇත.
  - ශිෂ්‍යාධාර ලබා දෙන අයදුම්කරුවන් සංඛ්‍යාව 20,000 ක් වන අතර, ඒ අතුරින් ශිෂ්‍යත්ව 250 ක් විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් සඳහා වෙන් කර ඇත.
  - විභාග අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව, දිස්ත්‍රික්කය හා මාධ්‍යය අනුව කඩඉම් ලකුණු සීමාව තීරණය කර ඇත.
  - විශේෂ අවශ්‍යතා කාණ්ඩය යටතේ ශිෂ්‍යත්ව හිමිකම් ලබන අයදුම්කරුවන්ගේ මුළු ලකුණු සමඟ ශිෂ්‍යත්ව හිමිකම් ලැබූ බවට විශේෂ සටහනක් ඇතුළත් කර ඇත.

- ➢ සියලුම විදුහල්පතිවරුන් හට https://onlineexams.gov.lk/eic සබැඳියට පිවිසීම මගින් අයදුම්පත් එවීම සඳහා ලබාදී ඇති පරිශීලක නාම (User Name) සහ මුරපද (Password) භාවිතා කර අදාළ පාසලේ විභාග ප්‍රතිඵල ලේඛනය බාගත කර මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. අපේක්ෂකයන්ගේ කේවල සහතිකපත්, අභියාචනා සලකා බැලීමෙන් පසු පාසල් වෙත තැපැල් මගින් යොමු කරනු ලැබේ.

- ➢ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇති https://onlineexams.gov.lk/eic සබැඳිය මගින් තම පළාතේ / කලාපයේ සියලු පාසල්වල ප්‍රතිඵල බාගත කර ගැනීම / නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සලසා ඇත.

- ➢ කිසියම් විභාග අපේක්ෂකයකුගේ ලකුණු පිළිබඳව අභියාචනා කිරීමට අවශ්‍ය වනතේ නම්, ඒ සඳහා මාර්ගගතව අභියාචනා ඉදිරිපත් කල යුතු දිනය පසුව දැනුම්දෙනු ලැබේ.

- ➢ විමසීම

| | |
|---|---|
| ක්ෂණික දුරකථන | - 1911 |
| දුරකථන අංක | - 0112785922, 0112784537, 0112786616, 0112784208 |

ඒ.කේ.එස්.ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල
2026 සැප්තැම්බර් 02 දින